ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2016
## 13 ශ්‍රේණිය
## ව්‍යාපාර අධ්‍යයනය
## I කොටස

කාලය පැය 2 යි.

- ප්‍රශ්න අංක. 01 සිට 30 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

01) ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික සාධකය වනුයේ,

1) මුදල් 2) භාණ්ඩ හා සේවා 3) ලාභ
4) ගනුදෙනුකරුවන් 5) නිෂ්පාදන සාධක

(............)

02) පහත සඳහන් දෑ අතුරින් එකක් හැර සෙසු සියල්ල ව්‍යාපාරයක පොදු අරමුණු ලෙස සැලකිය හැකිය. එසේ පොදු අරමුණක් ලෙස නොසැලකෙන්නෙ කුමක්ද?

1) ලාභ ලැබීම. 2) වෙළෙඳපොලේ රැඳී සිටීම. 3) රැකි රක්ෂා සැපයීම.
4) වෙළෙඳපොල කොටස වැඩිකර ගැනීම. 5) වර්ධනය

(............)

03) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

A - දැනුම නිෂ්පාදන සම්පතකි.

B - ක්‍රය ශක්තිය තුළින් ඉල්ලුම හටගනී.

C - ඍජු නිෂ්පාදනය නිසා වෙළෙඳාම ආරම්භ විය.

D - කාර්මික හා පාරිභෝගික භාණ්ඩ අතර මූලික වෙනස රඳාපවතින්නෙ මිලදී ගැනීමේ අරමුණ අනුවය.

E - හුවමාරුව සඳහා මූලික කරුණු කිහිපයක් සම්පූර්ණ විය යුතුය.

1) A, C හා D 2) A, B හා D 3) A, C හා E 4) A, D හා E 5) B, D හා E

(............)

04) පහත දැක්වෙන්නේ ස්වාභාවික පරිසරයේ සම්පත් කිහිපයකි.

අ) ආහාර ආ) වන ඇ) දියමන්ති
ඈ) ගල් අඟුරු ඉ) ධීවර ඊ) ඛනිජ තෙල්

1) අ - ආ - ඇ හා ඈ 2) අ - ආ - ඉ හා ඊ 3) අ - ආ හා ඉ
4) ඇ - ඈ හා ඊ 5) ආ - ඇ හා ඈ

ඉහත ඒවායින් සීමිත එහෙත් අළුත් කළ හැකි සම්පත් මොනවාද?

(............)

05) ව්‍යාපාර සමාජ වගකීම්වලට අදාළ සාධක කිහිපයක් පහත දැක්වේ.

A - අයිතිකරුවන්ට සාධාරණ ඉපයීම්
B - නිෂ්පාදිතයේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍යාන්විත බව
C - හරිත නිෂ්පාදිත
D - වෘත්තිය ආරක්ෂාව
E - කළමණාකරණයේ විනිවිදභාවය
F - බදු ගෙවීම

ඉහත සාධක අතුරින් සමාජය (society) සම්බන්ධයෙන් වූ ව්‍යාපාරික සමාජ වගකීම් වනුයේ,

1) A හා B පමණි. 2) B හා C පමණි. 3) B හා E පමණි.

4) C හා D පමණි. 5) C හා F පමණි.

(............)

06) සීමිත පොදු සමාගමක කොටස් හිමියා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට බලය පවරන ලියවිල්ල කුමක්ද?

1) සංස්ථා ප්‍රකාශය 2) සාංගමික ව්‍යවස්ථාවලිය 3) කොටස් බලපත්‍රය
4) ප්‍රතිෂ්ඨාව 5) ප්‍රතියුක්ත පත්‍රය

(............)

07) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සීමාසහිත පෞද්ගලික සමාගමකට අදාළවන ප්‍රකාශය කුමක්ද?

1) කොටස්කරුවන්ට අසීමිත වගකීමක් තිබේ.
2) කොටස් ප්‍රාග්ධනයක් සඳහන් නොවේ.
3) කොටස් වෙළෙඳපොල තුළ කොටස් අලෙවිය සිදුවේ.
4) සංස්ථා ප්‍රකාශයක් මගින් කොටස් විකිණීම සිදු කරයි.
5) සමාගම කොටස්කරුවන්ගෙන් වෙන්වූ නීතිමය ඒකකයකි.

(............)

08) පහත දැක්වෙන්නෙ ව්‍යවසායකත්වය කෙරෙහි බලපාන සාධක කිහිපයකි.

A - පරිකල්පනික චින්තනය B - මනෝවිහිතිය C - අනුකරණය

D - ගතානුගතිකවීම E - ආදර්ශ චරිත F - උසස් අධ්‍යාපනය

මේවා අතුරින් ව්‍යවසායකත්වය සංවර්ධනයට බාධා ලෙස සැලකෙන්නේ,

1) A, B හා C ය. 2) B, C හා D ය. 3) C, D හා E ය. 4) D, E හා F ය. 5) B, E හා F ය.

(............)

09) "කවින් වෙළෙඳ දැන්වීමක පෙනී සිටීම සඳහා විනාඩියකට රු.50,000/-ක් අය කරයි. " මේ ප්‍රකාශය තුළින් කියවෙන්නෙ මින් කුමක් පිළිබඳව ද?

1) ද්විත්ව සමපාතය ගැනය.
2) මුදල විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස ක්‍රියාකරන බව
3) මුදල වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියාකරන බව
4) මුදල් පොදුවේ පිළිගන්නා බවය.
5) මුදල වටිනාකමේ මිනුම් දණ්ඩක් බවය.

(............)

10) "අනුෂාංගික අලාභ රක්ෂණ ඔප්පුව" මෙය,

1) ජීවිත රක්ෂණක ඔප්පුවකි
2) මුහුදු උවදුරු රක්ෂණ ඔප්පුවකි
3) ගිනි රක්ෂණ ඔප්පුවකි
4) පුද්ගල හදිසි අනතුරු රක්ෂණ ඔප්පුවකි
5) රථවාහන රක්ෂණ ඔප්පුවකි

(............)

11) අනුර සිය ලක්ෂ 6ක නිවස රු. 200 000 ට X රක්ෂණ සමාගමේ ද රු.400 000 කට Y රක්ෂණ සමාගමේ ද රක්ෂණය කළේය. ගින්නකින් අනුරගේ නිවසට රු.240 000 අලාභයක් සිදුවිය. දායකත්වය මූලධර්මය අනුව X හා Y සමාගම් ගෙවිය යුතු වන්දිය කොපමණ ද?

1) X සමාගම රු. 240 000 Y සමාගම රු.240 000
2) X සමාගම රු.120 000 Y සමාගම රු.120 000
3) X සමාගම රු.80 000 Y සමාගම රු.160 000
4) X සමාගම රු.160 000 Y සමාගම රු.80 000
5) X සමාගම රු.40 000 Y සමාගම රු.200 000

(............)

12) පහත ඒවා අතුරින් විද්‍යුත් තැපැල වැනි සන්නිවේදන ක්‍රමයක දුර්වලතාවයක් ලෙස පිළිගත හැක්කෙ කුමක්ද ?

1) වේගවත් නොවීම.
2) පසු පෝෂණයට අවස්ථාවක් නොවීම.
3) තේරුම් ගැනීම අපහසුවීම
4) තනිකම වැනි ස්වභාවයක් නිර්මාණය වීම.
5) අධික පිරිවැයක් දැරීමට සිදුවීම.

(............)

13) ආනයනකරුවෙකු විසින් ආනයනය කරන ලද භාණ්ඩ තොගයක අයිතිය ප්‍රකාශ කිරීම සඳහා රේගුවට ඉදිරිපත් කළ යුතු ලියවිල්ලකි.

1) නෞභාරපත
2) ණයවර ලිපිය
3) ඉන්වොයිසිය
4) ප්‍රභවස්ථාන සහතිකය
4) ආනයන සටහන්කරය

(............)

14) ගෝලීය වෙළෙඳ සහයෝගිතාවය සඳහා රටවල් 5 ක් ඇති කරගෙන තිබෙන සංවිධානයකි. BRICS මෙහි සාමාජික රටවල් 5 නිවැරදිව සඳහන් කාණ්ඩය තෝරන්න.

1) බ්‍රිතාන්‍ය - රුසියාව ඉන්දියාව - චීනය - දකුණු අප්‍රිකාව
2) බ්‍රසීලය - රුසියාව - ඉන්දියාව - චීනය - දකුණු අප්‍රිකාව
3) බොලිවියාව - රුවන්ඩාව - ඉන්දියාව - චීනය - දකුණු අප්‍රිකාව
4) බ්‍රසීලය - රුමේනියාව - ඉන්දියාව - චීනය - දකුණු අප්‍රිකාව
5) බ්‍රසීලය - රුසියාව - අයර්ලන්තය - චීනය - දකුණු අප්‍රිකාව

(............)

15) "පාසලකට පත්ව ආ නව විදුහල්පතිවරයා නියෝජ්‍ය විදුහල්පති හා අංශ ප්‍රධාන ගුරුභවතුන්ට පාසල් කළමණාකරන කටයුතු පවරා දෙමින් අවශ්‍ය බලතල හා වැඩ කිරීමේ නිදහස ලබා දෙන ලදී." මෙයින් විද්‍යාමාන වන සංවිධානකරණ ලක්ෂණය වන්නේ,

1) පාලන අවකාශය  2) වගවීම  3) විමධ්‍යගතකරණය
4) මධ්‍යගතකරණය  5) වගකීම

(............)

16) ඕනෑම සංවිධානයක අරමුණු ඉටුකර ගැනීම සඳහා නිවැරදිව සම්පත් බෙදාදීමත්, එම සම්පත් හා කාර්යයන් සම්බන්ධීකරණය අවශ්‍ය වේ. මෙය හඳුන්වන්නේ,

1) මාණ්ඩලිකරණය ලෙසය.  2) මෙහෙයවීම ලෙසය  3) සංවිධානකරණය ලෙසය
4) උපායගිලි කළමනාකරණය ලෙසය  5) විමධ්‍යගත කරණය ලෙසය

(............)

17) කර්මාන්ත ශාලාවෙක සුපරීක්ෂකයකු ලෙස සේවය කරන රණවීර මහතා සේවකයන්ගෙන් නිතරම වැඩ ගැනීමට දැඩි අවධානයක් යොමු කරයි. ඔහුගේ නායකත්වය ශෛලිය වනුයේ,

1) ඒකාධිපති නායකත්ව ශෛලිය  2) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය
3) නිර්බාධවාදී නායකත්ව ශෛලිය  4) කාර්ය අභිමුඛ නායකත්ව ශෛලිය
5) සේවක අභිමුඛ නායකත්ව ශෛලිය

(............)

18) කිසියම් නිෂ්පාදන ආයතනයක ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරු ඔබට සපයා ඇත.

- වාර්ෂික ස්ථාවර පිරිවැය රු.800 000
- ද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය - ඒකකයට රු.2000
- ප්‍රවාහන පිරිවැය ඒකකයකට රු.600
- ඒකකයක විකුණුම් මිල - 3000

මෙම ආයතනයේ සමච්ඡේදන ඒකක ප්‍රමාණය වනුයේ,

1) 160  2) 308  3) 400  4) 2000  5) 8000

(............)

19) ඇඟලුම් කර්මාන්ත ශාලාවක නිෂ්පාදන කළමනාකරු විසින් ස්ථාපිත කරන ලද ප්‍රමිතියකට අනුව මසන ලද ඇඟලුම් නිශ්චිත රටාවකට අනුව පරීක්ෂා කෙරේ. මෙම ක්‍රියාවලිය හැඳින්වෙන්නෙ,

1) තොග පාලනය ලෙසය  2) නිෂ්පාදන පාලනය ලෙසය  3) නිෂ්පාදිත සංවර්ධන ලෙසය
4) නියැදි පරීක්ෂාව ලෙසය  5) තත්ත්ව පාලනය ලෙසය .

(............)

20) අළුතින් ආරම්භ කරන ලද සංචාරක හෝටලයක කළමනාකරණය විසින් ඉතාමත් ප්‍රණීත ආහාර පාන සෞඛ්‍යාරක්ෂිත ආකාරයට සැපයීම කටයුතු කරයි. මෙම ආයතනය පසුවන නිෂ්පාදන මට්ටම කුමක්ද?

1) මූලික නිෂ්පාදිතය  2) අපේක්ෂිත නිෂ්පාදිතය  3) වර්ධිත නිෂ්පාදිතය
4) විභව නිෂ්පාදිතය  5) හර ප්‍රතිලාභ නිෂ්පාදිතය

(............)

21) නිෂ්පාදනය මහ පරිමාණයෙන් වැඩිකොට සාධාරණ මිලකට කඩිනමින් බෙදාහැරීම කවර අලෙවිකරණ සංකල්පයට අයත් වේද?

1) නිෂ්පාදන සංකල්පය  2) නිෂ්පාදිත සංකල්පය  3) විකුණුම් සංකල්පය
4) අලෙවිකරණ සංකල්පය  5) ගණුදෙනුකාර සංකල්පය

(............)

22) "බීටා" පාවහන් සමාගම පාසල් ළමුන් මිලට ගන්නා සෑම පාවහන් යුගලයකටම අත් ඔරලෝසුවක් නොමිලේ ලබාදෙයි. මෙයට අදාළ ප්‍රවර්ධන ක්‍රමය වනුවේ,

1) සෘජු අලෙවිකරණය  2) වෙළෙඳ ප්‍රවර්ධනය  3) පාරිභෝගික ප්‍රවර්ධනය
4) විකුණුම් සේවක ප්‍රවර්ධනය  5) පෞද්ගලික අලෙවිය

(............)

23) පහත සඳහන් කරුණු අතුරින් ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලනොපාන කරුණ කුමක්ද?

1) ව්‍යාපාර ස්වභාවය හා ප්‍රමාණය  2) ඉල්ලුමේ ස්වභාවය  3) ණය ප්‍රතිපත්තිය
4) මිල මට්ටමේ වෙනස්වීම  5) මිල කිරීමේ ප්‍රතිපත්තිය

24) මූල්‍ය වෙළෙඳපල ප්‍රාථමික හා ද්විතියික වශයෙන් වර්ග කිරීමේ පදනම වන්නෙ පහත ඒවායින් කුමක්ද?

1) මූල්‍ය උපකරණ කල් පිරීමේ කාලය  2) මූල්‍ය අතරමැදිකරණය අනුව
3) මූල්‍ය උපකරණවල බිහිවීම අනුව  4) මූල්‍ය උපකරණවල ස්වභාවය අනුව
5) මූල්‍ය වෙළෙඳපොල සංවිධානාත්මක ව්‍යුහය මත

(...........)

25) පහත දැක්වෙන්නෙ මූල්‍ය උපකරණ කිහිපයකි.

A- සාංගමික ණයකර B- භාණ්ඩාගාර බිල්පත් C- වාණිජ පත්‍රිකා

D- කොටස් බලපත්‍ර E- සාමාන්‍ය කොටස් F- ඒකෂණ ණය

G- බැංකු අයිරාව H- රුපියල් සුරැකුම්පත්

ඉහත මූල්‍ය උපකරණ අතුරින් ප්‍රාග්ධන වෙළෙඳපොලේ හුවමාරු වන උපකරණ ලෙස පිළිගත හැකි වන්නේ,

1) A, B, D හා E ය 2) A, C, D හා F ය 3) B, E, G හා H ය

4) A, D,E හා H ය 5) A, E,F හා H ය

(...........)

26) පහත දැක්වෙන කරුණු අතුරෙන් මානව සම්පත් කළමනාකරණ ඉලක්කයක් ලෙස පිළිගත හැක්කේ කුමක්ද?

1) සේවක සංවර්ධනය 2) සේවක ආකර්ශනය 3) කාර්යඵල ඇගයීම

4) පුහුණුව හා සංවර්ධනය 5) සේවක සුභසාධනය

27) සංවිධානයක ප්‍රධාන තනතුරුවල ඇතිවිය හැකි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු සේවකයන් හඳුනාගැනීමට සකස් කරන වැඩපිළිවෙල හඳුන්වන්නේ,

1) කුසලතා ලේඛන 2) රැකියා ප්‍රසිද්ධ කිරීම 3) සේවක ප්‍රවාශිතාවය

4) අනුප්‍රාප්තික සැලැස්ම 5) කුසලතා ඉන්වෙන්ටරි

(...........)

28) පහත සඳහන් සාධක අතුරින් සේවක වැටුප් හා වේතන සඳහා සෘජුවම බලනොපාන සාධකය කුමක්ද?

1) ශ්‍රම ඉල්ලුම හා සැපයුම 2) දරණ තනතුරු නාමය 3) ජීවන වියදම

4) රජයේ නීති හා රෙගුලාසි 5) සේවක ඵලදායකත්වය

(...........)

29) මෙවර අ.පො.ස (උ/ පෙළ) විභාගයේ එක් එක් සිසුවා ලබාගත් Z ලකුණ අනුව විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව විභාග දෙපාර්තමේන්තුව ප්‍රකාශයට පත්කර ඇත. මෙම තොරතුරු වර්ගීකරණයට කවර පදනමක් යොදාගෙන තිබේද?

1) මූලාශ්‍රය අනුව 2) ස්වභාවය අනුව 3) සිදුවීම අනුව

4) සමූහගතවීම අනුව 5) සම්භාවිතාව අනුව

(...........)

30) නිෂ්පාදිතයක ගුණාත්වය ඉහළ නංවාගත හැකි ක්‍රම විස්තර කරන්නෙ, ව්‍යාපාර සැලැස්මක,

1) මෙහෙයුම් සැලැස්මේය 2) මානව සම්පත් සැලැස්මේය 3) මූල්‍ය සැලැස්මේය

4) අලෙවිකරණ සැලැස්මේය 5) විධායක සාරාංශයේය

(...........)

- **ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට අදාළ නිශ්චිත පිළිතුරු සපයන්න.**

31) අ) ව්‍යාපාරයක නිෂ්පාදිතවලට සමාන නිෂ්පාදිත සපයන වෙනත් ව්‍යාපාර .............................................. වන අතර, ව්‍යාපාර සපයන නිෂ්පාදිත වෙනුවට භාවිතා කළ හැකි වෙනත් නිෂ්පාදිත සපයන ව්‍යාපාර .............................................. ලෙස හඳුනාගත හැකිය.

ආ) ජාති, ආගම්, වැනි සාධක මත විෂම ලෙස නොසැලකීම .............................................. අදාළ ආචාර ධර්මයක් වන අතර, ප්‍රකාශන අයිතින් වංචනික ලෙස යොදා නොගැනීම .............................................. අදාළ ආචාර ධර්මයකි.

32) අ) රටක ආර්ථික කාර්යක්ෂමතාවය .............................................. කාර්යක්ෂමතාවය සහ .............................................. කාර්යක්ෂමතාවය ලෙස කොටස් දෙකකි.

ආ) රජයක් විසින් දිගුකාලීන අයෝජන සඳහා දරණ වියදම් .............................................. වන අතර, රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට දරණ වියදම් .............................................. වේ.

33) අ) පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් ප්‍රාග්ධනය යොදන ව්‍යාපාර .................................................. ව්‍යාපාර වන අතර, රජය හෝ රාජ්‍ය ආයතන ප්‍රාග්ධනය යොදන ව්‍යාපාර .................................................. ව්‍යාපාර වේ.

ආ) රජයේ දෙපාර්තමේන්තුවල කටයුතු පාලනය වන ප්‍රධාන උපකරණ දෙක වන්නේ,

1. .................................................. 2. ..................................................

34) අ) මුදලක ද්‍රව්‍යාත්මක අගය එහි මුණත අගයට සමාන වන මුදල්, .................................................. වන අතර, මුණත අගයට වඩා ද්‍රව්‍ය අගය අඩු මුදල් .................................................. වේ.

ආ) වර්තමාන රජය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව අයත් අමාත්‍යාංශය වනුයේ, .................................................. ය.

35) අ) 2014 මහ බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන රට .................................................. වන අතර, ප්‍රධාන අපනයන රට .................................................. ය.

ආ) තීරු ගාස්තු නොගෙවූ භාණ්ඩ, තීරු ගාස්තු ගෙවා නිදහස් කරගන්නා තුරු වරායේ, ගබඩා කර ඇති ස්ථානය .................................................. වන අතර, එම භාණ්ඩවල වගකීම භාර ගනිමින් රේගු බලධාරීන් නිකුත් කරන ලියවිල්ල .................................................. වේ.

36) අ) නිල සංවිධාන ව්‍යුහය අනුව පිළිගත් පැහැදිලි පණිවුඩ හුවමාරු ක්‍රමය .................................................. වන අතර, ආයතනය තුළ පැහැදිලිව සඳහන් වී නොමැති නිල නොවන සන්නිවේදන ක්‍රම .................................................. යි.

ආ) කළමනාකරුවෙකු සතු විශ්ලේෂණ හා නිර්මාණාත්මක බුද්ධිය .................................................. කුසලතා වන අතර, සිතීමට නොව කාර්ය කිරීමට ඇති හැකියාව .................................................. කුසලතා වේ.

37) අ) මෝටර් රථ, විදුලි උපකරණ නිෂ්පාදනයට වඩාත් සුදුසු පිරියත සැලසුම් වන්නේ .................................................. යි. නාවික යාත්‍රා, ක්‍රීඩා සංකීර්ණ වැනි නිෂ්පාදිත සඳහා සුදුසු පිරියත සැලසුම් ක්‍රමය .................................................. යි.

ආ) ගබඩාවක ද්‍රව්‍ය තොග යම් මට්ටමකට වඩා අඩුවීමට ඉඩ නොහැරේද? ඒකී මට්ටම .................................................. යි. ආයතනයක තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වන පරිදි වරකට ඇණවුම් කළ යුතු ඒකක ප්‍රමාණය .................................................. යි.

38) අ) පාරිභෝගික අවශ්‍යතා වුවමනා ඉටු කිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව .................................................. යි. ඒ පිළිබඳ පාරිභෝගිකයාගේ ඇස්තමේන්තුව නැතහොත් තක්සේරුව .................................................. යි.

ආ) ආයතනයේ ප්‍රතිරූපය හා එහි නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් .................................................. වන අතර, විකුණුම්කරු විසින් නිශ්චිත පුද්ගලයෙකු වෙත තම නිෂ්පාදන විදහා දැක්වීම මගින් ඇණවුම් ලබා ගැනීමේ ක්‍රමය .................................................. යි.

39) අ) තනතුරකට බඳවාගත් සේවකයෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙරාතුව සේවය කළ යුතු කාලය .................................................. වන අතර, කිසියම් ශිල්පීය වෘත්තියකට බඳවා ගත් සේවකයෙකු ගතකළ යුතු පුහුණු කාලය .................................................. යි.

ආ) නිශ්චිත කාලසීමාවක් තුළ රැකියා කොන්දේසි පිළිබඳ වෘත්තීය සමිති හා කළමනාකරණය අතර පවත්නා සාකච්ඡා .................................................. වේ. එමගින් දෙපාර්ශවය අතර ඇති කරගන්නා එකඟතාවය .................................................. යි.

40) අ) ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර සම්බන්ධතාව .................................................. වන අතර අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය අඩු නම් එය .................................................. කි.

ආ) සංවිධානයක දැනුම සේවකයන්ට සහය වන පද්ධති .................................................. වන අතර දත්ත සේවකයන්ට සහය වන පද්ධති .................................................. වේ.

• ප්‍රශ්න අංක. 41 සිට 50 දක්වා ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සොයන්න.

41) ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේ දී ප්‍රමුඛතාවය දිය යුතු අංශ හතරක් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) අවධාරණය කරයි. ඒවා නම් කරන්න.

1) .................................... 2) ....................................

3) .................................... 4) ....................................

42) 1995 මැන්චෙස්ටර් සමුළුවේ දී ප්‍රකාශ කළ සමුපාකාර ප්‍රතිපත්ති වලින් හතරක් දක්වන්න.

1) .................................... 2) ....................................

3) .................................... 4) ....................................

43) අ) සුළු ව්‍යවසායකයන්ට අවශ්‍ය සහය ලබාගත හැකි, පහත කෙටි යෙදුම්වලින් හඳුන්වන ආයතන නම් කරන්න.

NIBM - ....................................

IDB - ....................................

ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන, තැන්පතු භාරගන්නා ආයතන දෙකක් නම් කරන්න.

1) .................................... 2) ....................................

44) අ) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන සේවාව පරිපාලනය කරනු ලබන්නේ .................................... විසිනි.

කොළඹ වරායේ පරිපාලනය පැවරී ඇති ආයතනය කුමක් ද? ....................................

ආ) රටක ජාත්‍යන්තර වෙළඳාමේ ස්වභාවය විශ්ලේෂණයට යොදාගත හැකි මූලික මිනුම් දෙකක් සඳහන් කරන්න.

1) .................................... 2) ....................................

45) පහත සඳහන් ව්‍යාපාර ආයතන නියාමනය කරනු ලබන රාජ්‍ය ආයතන නම් කරන්න.

| | ව්‍යාපාරය | නියාමකයා |
|---|---|---|
| 1) | රක්ෂණ ආයතන | |
| 2) | මූල්‍ය සමාගම් | |
| 3) | කොටස් තැරැව්කාර සමාගම් | |
| 4) | හෝටල් හා ආපනශාලා | |

46) අ) දේශීය විදේශීය ආයෝජකයින්ට පහසුකම් සපයන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙනුවට ස්ථාපිත නව ආයතනය කුමක් ද? ....................................


ආ) ව්‍යාපාරයක ශේෂ පත්‍රයකින් උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් | රු. මිලියන | 60 |
| 14% ණයකර | රු. මිලියන | 30 |
| රඳවාගත් ඉපයුම් | රු. මිලියන | 10 |

ඉහත තොරතුරු අනුව මෙම ව්‍යාපාරයෙන් පවත්වන්නේ කුමන තෝලන තත්ත්වයක් ද?

....................................

47) පහත දැක්වෙන සමච්ඡේදන ප්‍රස්ථාරයේ A, B, C හා D අක්ෂර මගින් දක්වා ඇත්තේ මොනවාදැයි නම් කරන්න.




A- ..............................................................

B- ..............................................................

C- ..............................................................

D- ..............................................................

48) අ) කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ නවත මිල දර්ශකය වන S and P SL20 දර්ශකයට සමාගම් තෝරාගැනීමේ දී සලකා බලන නිර්ණායක අතුරින් දෙකක් දක්වන්න.

1) .............................................................................. 2) ..............................................................................

ආ) සාමාන්‍ය කොටස් වල ආයෝජනය කරන්නෙකුට ලාභාංශ ආදායමට අමතරව ලැබෙන වෙනත් ඍජු ප්‍රතිලාභ දෙකක් පෙන්වා දෙන්න.

1) .............................................................................. 2) ..............................................................................

49) පහත දැක්වෙන වගුව භාවිතා කරමින් තොරතුරු පද්ධතියක උපාංග සහ තොරතුරු පද්ධතියක කාර්යයන් හතරක් ලියා දක්වන්න.

| | උපාංග | කාර්යයන් |
|---|---|---|
| 1) | | |
| 2) | | |
| 3) | | |
| 4) | | |

50) අ) අන්තර්ජාලයේ ඇති නවතම ගීතයක් ඔබගේ ජංගම දුරකථනයට බාගත (Down Lord) කර ගැනීමට ඔබට අවශ්‍ය පහසුකම කුමක් ද? ..............................................................................

ඔබගේ නිවසේ සිට අන්තර්ජාලය තුළින් පාසලේ පරිගණක මධ්‍යස්ථානයේ ඇති පරිගණයක් භාවිතා කිරීමේ හැකියාව කුමක් ද? ..............................................................................

ආ) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත මූල්‍ය සැලැස්මට ඇතුළත් කරන මූල්‍ය ප්‍රකාශන දෙකක් නම් කරන්න.

1) .............................................................................. 2) ..............................................................................

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2016
## 13 ශ්‍රේණිය
## ව්‍යාපාර අධ්‍යයනය
## II කොටස

කාලය පැය 3 යි.

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

01) i) අ) නිෂ්පාදිත භාණ්ඩ හා සේවා වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. එසේ භාණ්ඩ හා සේවා වශයෙන් වර්ග කිරීමේ පදනම පැහැදිලි කරන්න.

ආ) භාණ්ඩ නිපදවන ව්‍යාපාර වලට සාපේක්ෂව සේවා සපයන ව්‍යාපාරවල වැඩිවීමක් දැකිය හැකිය. මෙයට බලපාන සාධක හතරක් දක්වන්න.

ii) සිරිසේන නිවස ආශ්‍රිතව කුඩා පරිමාණයේ ගොවිපලක් පවත්වා ගෙන යන ගොවියෙකි. ඔහු වගා කරන ධාන්‍ය, එළවළු හා පලතුරු වගාවෙන් කොටසක් සිය පවුලේ පරිභෝජනය සඳහා යොදා ගන්නා අතර, අතිරික්තය සිල්ලර වෙළඳසැල්වලට අලෙවි කරයි. එම අලෙවියෙන් ලැබෙන මුදලින් සිය ගොවිපලට අවශ්‍ය යම් යම් කෘෂි උපකරණ මිලට ගැනිමටත්, සිය පවුලේ අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනිමට කුළුබඩු, ටින්මාළු, කිරිපිටි වැනි දෑ මිලට ගැනිමටත් වැය කරයි.

ඉහත සිද්ධියෙන් උදාහරණ මතුකර ගනිමින් පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

අ) ඍජු නිෂ්පාදන　　ආ) වක්‍ර නිෂ්පාදනය

ඇ) පාරිභෝගික භාණ්ඩ　　ඉ) ව්‍යාපාරික භාණ්ඩ

iii) පහත දැක්වෙන එක් එක් ව්‍යාපාර සැලකිල්ලට ගෙන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය යන නිෂ්පාදන සාධක වෙන් කර දක්වන්න.

ඔබේ පිළිතුර සඳහා පහත දැක්වෙන ආකාරයේ වගුවක් යොදා ගන්න.

අ) සත්ත්ව ගොවිපලක්　　ආ) ගෘහ භාණ්ඩ නිපදවන ව්‍යාපාරයක්

ඇ) බේකරියක්　　ඈ) ආපන ශාලාවක්

| ව්‍යාපාරය | භූමිය | ශ්‍රමය | ප්‍රාග්ධනය | ව්‍යවසාය |
|---|---|---|---|---|
| | | | | |

iv) අ) වර්තමාන ශ්‍රී ලංකාවේ කැලිකසල විශාල පාරිසරික ප්‍රශ්නයකි. මෙම අපද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන්නේ ද ? නැතිනම් බෙදාහැරීමේ හා අලෙවි කිරීමේ ක්‍රියාවලියේ තුළින් සිදුවන්නේ ද? පැහැදිලි කරන්න.

ආ) නාගරික ප්‍රදේශවල කැලිකසල අර්බුදය විසඳා ගැනිමට අදාළව ඵලදායි යෝජනා ඉදිරිපත් කරන්න.

v) අ) කිසියම් ව්‍යාපාරයක සමාජ වගකීම් හා ලාභය අතර පවත්නා සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

ආ) වර්තනමානයේ බොහෝ සමාගම් ආචාරධර්ම සංග්‍රහය (Code of Ethics) ලිඛිතව තබා ගැනිමට උත්සාහ ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02) ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වුවද වර්තමානය වන විට යම් යම් කෘෂිභෝග පිටරටින් ආනයනය කිරීමට වසරකට විශාල මුදලක් වැය කරයි.

i) අ) මේ තත්ත්වය මත දේශීය කෘෂි භෝග නිෂ්පාදකයා මුහුණපාන ගැටලු කවරේද?

ආ) මේ තත්ත්වය පාලනය කිරීමට රජයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

ඉ) මෙය කවර ආර්ථික අරමුණ කෙරෙහි අහිතකර ලෙස බලපායිද ?

ii) අ) ජාතික ප්‍රමිති පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් රටකට අත්වන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න.

ආ) රූපලාවන්‍යාගාරවල සීඝ්‍ර ව්‍යාප්තිය මෙන්ම ඒවායෙන් සේවා ලබා ගන්නා පාරිභෝගිකයන් මුහුණදෙන විෂමාචාර වලද වර්ධනයක් ද දැකිය හැකිය. මේ තත්ත්වය මගහරවා ගැනීමට පහත පාර්ශව වලට ගත හැකි ක්‍රියාමාර්ග දෙක බැගින් දක්වන්න.

ඉ) පාරිභෝගිකයන්ට

ඊ) රජයට

iii) මානවිකා සහ චුලනිකා යන දෙදෙනා පරිගණක මෘදුකාංග නිර්මාණකරුවන් ලෙස හවුල් ව්‍යාපාරයක යෙදී සිටිති. මානවිකා ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳ විශේෂඥවරයියක් වන අතර, චුලනිකා වඩා උසස් සමෝධානික භාවිත මෘදුකාංග නිර්මාණ ගැන විශේෂඥවරයකි.

අ) මොවුන් දෙදෙනාට "හවුල් ව්‍යාපාර" සංවිධාන ක්‍රමය වඩා යෝග්‍ය යැයි ඔබ සිතන්නේ ද? හේතු දක්වන්න.

ආ) මොවුන් දෙදෙනාට සුමට ලෙස හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට ප්‍රයෝජනවත් "හවුල් ගිවිසුමක" අන්තර්ගත විය යුතු දෑ පෙන්නුම් කරන්න.

iv) අ) ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචි කිරීමේ ගාස්තුව විශාල වශයෙන් වැඩි කිරීමට පසුගිය අයවැය මගින් යෝජනා විය. මෙයින් සමාගම් මුහුණ පාන ගැටලු පැහැදිලි කරන්න.

ආ) සමාගම් ලියාපදිංචි කිරීමේ බලතල කවුරුන් සතු ද?

ඉ) ලියාපදිංචි කළ බවට නිකුත් කරන සහතිකය කුමක් ද?

ඊ) 2014 අංක. 13 දරණ සමාගම් (සංශෝධන) පනත අනුව සමාගමක ලියාපදිංචිය අළුත් කිරීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා දෙකක් දක්වන්න.

v) අ) විසිවන සියවස අගභාගය වන විට ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රචලිතව පැවති සමුපාකාර ව්‍යාපාරයක මේ වන විට පසුබෑමට ලක්ව තිබේ. මෙයට බලපෑ හේතු සාකච්ඡා කරන්න.

ආ) තමාගේම ස්වාධීන ව්‍යාපාරයක් ආරම්භ කරනවාට වඩා වරලත් ව්‍යාපාරයකට පිවිසීමෙන් කවර ප්‍රතිලාභ ලබාකර ගත හැකිද?

(ලකුණු 20)

03) i) පාසල් අවධියේ සිටම පියුමාල් සිය පියාගේ ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ කටයුතු වලට විවිධ අයුරෙන් උදව් කළේය. ලීබඩු කැටයම් කලාව පිළිබඳ ඇල්මක් දැක්වූ පියුමාල් එහිලා සහජ හැකියාවක් ද පෙන්නුම් කළේය. අවස්ථාව පරිදි කැටයම් කැපීමේ අත්හදා බැලීම් කල ඔහු ඒ පිළිබඳව පොත්පත් ද කියවීමට පුරුදු විය. සිය පියාගේ ගනුදෙනුකරුවන් ඉතා සුහදව ඇසුරු කළ පියුමාල් ඔවුන් අතර ප්‍රියමනාව පුද්ගලයෙක් බවට පත්විය. පියාගේ ඇවෑමෙන් ලීබඩු ව්‍යාපාරයේ එකම හිමිකරු බවට ඔහු පත්විය. සුවිශේෂ කැටයම් සහිතව නව විලාසිතාවක ගෘහභාණ්ඩ වෙළඳ පොලට හඳුන්වා දීම ඔහුගේ ප්‍රථම උත්සාහය විය. කෙටිකලකින් එම සුවිශේෂ නව විලාසිතා සහිත ගෘහ භාණ්ඩ ඉහළ මධ්‍ය පාන්තිකයන් අතර ජනප්‍රිය විය. විදේශ ගැනුම්කරුවන්ගෙන් ද ඇනවුම් ලැබෙන්නට විය.

අ) ඉහත විස්තරයේ සඳහන් වන පියුමාල් ව්‍යවසායකයකු ලෙස පිළිගත හැකිද? පැහැදිලි කරන්න.

ආ) මෙහි සඳහන් තොරතුරු වලට අනුව පියුමාල් තුළ විද්‍යාමාන වන ව්‍යවසායකත්ව ගති ලක්ෂණ කවරේද?

ii) අ) කුඩා ව්‍යාපාර ආරම්භ කර කෙටි කලකින් ඉන් බොහොමයක් අභාවයට යයි. මෙවැනි තත්ත්වයක් පැවතිමට හේතු කවරේදැයි පැහැදිලි කරන්න.

ආ) කුඩා ව්‍යාපාර සංවර්ධනයට ශ්‍රී ලංකා රජය දැනට ලබා දෙන සානුබලයන් කවරේද?

iii) හඳුන්වා දුන් මුල් අවධියේ ණයපත් භාවිතය වැඩිවූවද වර්තමානයේ එය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

අ) ණයපත හා හරපත අතර වෙනස පැහැදිලි කරන්න.

ආ) ණයපත් භාවිතය අඩුවීම කෙරෙහි බලපෑ හැකි හේතු කවරේදැයි දක්වන්න.

ඉ) ඔබට ණයපතක් ලබා ගැනීමට පැවතිය යුතු සුදුසුකම් අතුරෙන් දෙකක් දක්වන්න.

iv) වෑන් අංකල් නමින් පාසල් දරුවන් අතර ප්‍රචලිත මලිඳු සිය වෑන් රථයෙන් පාසල් දරුවන් ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යයි. ඔහු නවතම පහසුකම් සහිත වෑන් රථ දෙකක් ලබාගෙන සිය ව්‍යාපාරය පුළුල් කිරීමට අදහස් කරගෙන සිටියද, ඒ සඳහා ප්‍රධාන බාධකය මූල්‍ය දුෂ්කරතාවය යි.

අ) ඔහුට වෑන්රථ ලබා ගැනීමට වඩාත් සුදුසු ක්‍රමය කුමක් ද?

ආ) එම ක්‍රමය මගින් ඔහුට අත්කරගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව සිය අරමුණු කර යාම පිළිබඳ සුවිශේෂ කතාබහක් පසුගිය කාලයේ සමාජයේ පැවතුනි. මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් හා නියෝජිත කාර්යයන් දෙක බැගින් දක්වන්න.

v) අ) චෙක්පතක් පිටසන් කිරීම යනුවෙන් හඳුන්වන්නෙ කුමක් ද?

ආ) පිටසන් කිරීමෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද?

ඉ) පිටසන් කිරීමේ අවස්ථා මොනවාද?

ඊ) "හිස් පිටසන" හා "සීමාකාරී පිටසන්" වෙන වෙනම හඳුන්වන්න.

(ලකුණු 20)

04) i) අ) සනී මහතා හා ලියෝනි මහත්මිය විවාහක අඹුසැමියන්ව සිටියදී ඔවුනොවුන්ගේ ජීවිත සම්බන්ධව ජීවිත රක්ෂණයක් ලබාගෙන තිබිණි. ටිකකලකින් සනීගෙන් දික්කසාද වූ ලියෝනි, ජෝන් සමග විවාහ විය. පසුකලෙක සනී මිය ගියේය. ලියෝනි ට රක්ෂණ වන්දි හිමිකම් ලබා ගත හැකිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

1) ප්‍රතිරක්ෂණය 2) ප්‍රාරක්ෂණය

ආ) රක්ෂණය හා සම්බන්ධ පහත සංකල්ප පැහැදිලි කරන්න.

ii) අ) ශ්‍රී ලංකාවේ කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් පවතින බවට මාර්ගයේ ධාවනය වන නවීනතම රථවාහන ප්‍රමාණය වැඩිවෙමින්ම පැහැදිලිය. මේ ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

ආ) හොඳ ප්‍රවාහන ක්‍රමයකින් අපේක්ෂිත ගුණාංග හතරක් දක්වන්න.

iii) අ) පාසලකට විදුහල්පතිවරයෙකුට පහත එක් එක් පාර්ශවයට කිසියම් පණිවුඩයක් දැනුම් දීමට වඩාත් සුදුසු සන්නිවේදන ක්‍රම දෙකක් දක්වන්න.

1) පාසලේ සිසුන්ට 2) ආචාර්ය මණ්ඩලයට

ආ) වර්තමානයේ බෝහෝ විද්‍යුත් මාධ්‍යවල නිවේදකයන්ගේ කටයුතු සඵලදායි සන්නිවේදනයට බාධාවකි. ඔබ දකින එම අඩුපාඩු මොනවාද?

iv) අ) ශ්‍රී ලංකාවට තුළ සුපිරි වෙළඳසැල් කොතරම් ජනප්‍රිය වුවද මහජනයාගේ වැඩි දෙනෙකුගේ කැමැත්ත සම්ප්‍රදායික පොලවල් කෙරෙහිය. මෙසේ වීමට හේතු කවරේද?

ආ) වැඩි ගනුදෙනුකරුවන් ප්‍රමාණයක් ආකර්ශනය කර ගැනීමට සුපිරි වෙළඳසැල් හිමියන් ගන්නා උපක්‍රම කවරේද?

v) අ) වර්තමානය වන විට ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ නොවන රටක් නොමැත. මෙසේ ජාත්‍යන්තර වෙළඳාමේ ව්‍යාප්තිය හා වර්ධනය කෙරෙහි බලපෑ සාධක කවරේද?

ආ) කලාත්මක අත්කම් භාණ්ඩ නිපදවන දේශීය ව්‍යාපාරකයෙකුට සිය නිෂ්පාදිත විදේශ රටවලට අලෙවි කිරීමට අපේක්ෂා කරයි.

ඉ) විදේශ වෙළඳපොලට පිවිසීමෙන් ඔහුට ලැබිය හැකි ප්‍රතිලාභ කවරේද?

ඊ) විදේශ වෙළඳපලට පිවිසුන හොත් ඔහුට මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු කවරේද?

## II කොටස

05) i) ගජනායක මහතා මෙන්ම මදනායක මහතා ද සමාන සුදුසුකම් සහිත ජනප්‍රිය පාසල් දෙකක විදුහල්පතිවරුය. ගජනායක මහතා සෑම විටම සැලසුම් සහගතව කටයුතු කරන ආචාර්ය මණ්ඩලයේ අදහස් මෙන්ම දරුවන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් පාසලේ කටයුතු පරිපාලනය කරයි. සෑම දෙනාම සමග සුහදව කටයතු කරන ගජනායක මහතාගේ පාසල දිනෙන් දිනම ජනප්‍රියත්වයට පත්විය. මදනායක මහතා අවස්ථාවට අනුව කටයුතු කරන්නෙකි. අන් අයගේ අදහස් නොතකන ඔහු තමාට හිතවත් කිහිපදෙනෙකුගේ කේලාම් හා අදහස් අනුව හිතුමතේ කටයුතු කරයි. දැඩි ගති පැවතුම් ඇති කිසිවෙකු සමග සුහදව කටයුතු කිරීමට පවා නොහැකි ඔහුගේ පාසල දිනෙන් දිනම පිරිහීමට පත්වෙයි.

අ) ගජනායක මහතාගේ යහපත් කළමනාකරණ ගති ලක්ෂණ දෙකක් හා මදනායක මහතාගේ දුර්වල කළමනාකරණ ලක්ෂණ දෙකක් දක්වන්න.

ආ) පාසලක විදුහල්පතිවරයෙකු සතු විය යුතු කළමනාකරණ කුසලතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

ඉ) මොවුන් දෙදෙනාගේ නායකත්ව ශෛලීන් වෙන වෙනම නම් කරන්න.

ii) අ) කළමනාකරුවකු සිදුකරන පහත සඳහන් කාර්යයන් කවර කළමනාකරණ භූමිකාවට අයත්දැයි දක්වන්න.

1) සේවකයන් උසස් කිරීම. 2) දෙපාර්තමේන්තු රැස්වීම් පැවැත්වීම.
3) නව ව්‍යාපෘති හඳුන්වා දීම. 4) වාර්ෂික අයවැය ලේඛනය සැකසීම.

ආ) පහත දැක්වෙන්නේ කිසියම් සමාගමක තනතුරු කිහිපයකි. අධිකාරී බලය අනුව එම තනතුරු අයත් කළමනාකරණ මට්ටම කුමක්දැයි දක්වන්න.

1) ප්‍රධාන ලිපිකරු 2) විධායක අධ්‍යක්ෂ
3) මානව සම්පත් කළමනාකරු 4) වැඩ පරීක්ෂක

iii) අ) සංවිධානකරණයේ දී දෙපාර්තමේන්තු කිරීම පදනම් කිහිපයක් ඔස්සේ සිදුකරයි. එවැනි පදනම් හතරක් උදාහරණ සහිතව දක්වන්න.

ආ) පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍රවලට කළමනාකරණ පාර්ශවය මගින් ලබාදිය හැකි සේවක අභිප්‍රේරණ ක්‍රම දෙක බැගින් දක්වන්න.

1) ඇඟලුම් කම්හලේ කළමනාකරුවන් - කම්හලේ සේවක සේවිකාවන්ට
2) සංචාරක හෝටලයක කළමනාකරුවන් - හෝටල් සේවකයන්ට

iv) අ) කිසියම් කාර්මාන්ත ශාලාවක සිදුවන පහත කටයුතු කවර මෙහෙයුම් කළමනාකරණ කාර්යයට අයත්දැයි නම් කරන්න.

1) අවශ්‍ය ද්‍රව්‍ය වල ගුණය හා ප්‍රමාණය 2) නිෂ්පාදන වැඩසටහන සැකසීම.
3) තත්ත්ව පාලන කටයුතු 4) නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම.

ආ) පහත එක් එක් අවස්ථාවට සුදුසු නිෂ්පාදන ක්‍රමය නම් කර එහි එක් වාසියක් දක්වන්න.

1) මනාලියන්ට මංගල ඇඳුම් 2) සිසිල් බීම නිෂ්පාදනය

v) අ) නිෂ්පාදන කළමනාකරුවෙකු සිය ආයතනය සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී සැලකිය යුතු ප්‍රධාන සාධක හතරක් පෙන්වා දෙන්න.

ආ) සි/ස පිල්බුවා සමාගමේ 'x' නැමැති දවස අයිතමයට සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| වාර්ෂික ඉල්ලුම ඒකක | 10800 |
| අයිතමයක ඇනවුම් පිරිවැය | 100 |
| අයිතමයක රඳවා ගැනීමේ පිරිවැය | 6 |

ආර්ථික ඇනවුම් ප්‍රමාණය සොයන්න.

(ලකුණු 20)

06) i) අ) වර්තමානයේ බොහෝ ආයතන තත්ත්ව පාලනය ගැන වැඩි උනන්දුවක් දක්වයි. තත්ත්ව පාලනයෙන් ආයතනයක ලබාකරගත හැකි ප්‍රතිලාභ හතරක් පෙන්වා දෙන්න.

ආ) නිෂ්පාදන ආයතනයකට ඵලදායිතාවය වර්ධනය කරගත හැකි ක්‍රම හතරක් යෝජනා කරන්න.

ii) අලෙවිකරණයට පදනම් වූ හර සංකල්ප රාශියක් ඇත. එවැනි හර සංකල්ප අටක් නම් කර ඉන් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii) අ) ඇඳුම් වෙළඳපොල පදනම් හතරක් ඔස්සේ ඛණ්ඩය කර පෙන්වන්න.

ආ) ඔබ යොදාගත් ඛණ්ඩනයන් ඵලදායී වෙළඳපොළ ඛණ්ඩයක් වීමට පැවතිය යුතු අවශ්‍යතා හතරක් දක්වන්න.

iv) අ) පෞද්ගලික අංශයේ ආරෝග්‍ය ශාලාවක් ඇසුරෙන් සේවා අලෙවිකරණ මිශ්‍රය පැහැදිලි කරන්න.

ආ) පෞද්ගලික මගී ප්‍රවාහන සේවා බස් රථ සඳහා ගනුදෙනුකරුවන් ආකර්ශනය කරගත හැකි ක්‍රම පෙන්වා දෙන්න.

v) අ) පහත දැක්වෙන මූල්‍ය කළමනාකරණ තීරණ ආයෝජන තීරණ හා මූලාශ්‍ර තීරණ ලෙස වෙන් කර දක්වන්න.

1) වෙළඳතොග පිළිබඳ තීරණ
2) ලාභාංශ විභජනය පිළිබඳ තීරණ
3) ව්‍යාපාර විවිධාංගීකරණය
4) ප්‍රාග්ධන කෝලානය පිළිබඳ

ආ) සීමාසහිත පොදු සමාගමක් ලෙස මධ්‍යම ප්‍රමාණයේ ඇඟලුම් කම්හලක් ආරම්භ කිරීමට අදහස් කර ඇති අයෙකුගේ අරමුදල් අවශ්‍යතා හතරක් නම් කර ඒවා සම්පාදනය කරගත හැකි මාර්ග හතරක් දක්වන්න.

07) i) සී/ස ආටක නාටක සමාගමේ 2016.01.31 ශේෂ පත්‍රයෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| ජංගම වත්කම් | (රු. 000 වලිනි.) | ජංගම වගකීම් | |
|---|---|---|---|
| තොගය | 300 | ණයහිමියෝ | 170 |
| ණයගැතියො | 200 | ගෙවිය යුතු බිල් | 60 |
| කලින් ගෙවූ වියදම් | 100 | උපචිත වියදම් | 40 |
| මුදල් | 200 | ගෙවිය යුතු බදු | 130 |
| | 800 | | 400 |

අ) ඔබ විසින් පහත ඒවා ගණනය කරන්න.

1) ජංගම අනුපාතය
2) ක්ෂණික අනුපාතය

ආ) පහත ප්‍රකාශ සම්බන්ධයෙන් ඔබේ අදහස් දක්වන්න.

A- යම් ව්‍යාපාර ආයතනයක ජංගම අනුපාතය 4 කි.

B- යම් ව්‍යාපාරයක ණය අනුපාතය 60% කි.

ii) අ) පහත සඳහන් මූල්‍ය උපකරණ නිකුත් කරන ආයතන නම් කරන්න.

1) රුපියල් සුරැකුම්පත්
2) කොටස් බලපත්‍ර
3) තැන්පතු සහතික
4) වාණිජ පත්‍රිකා

ආ) සී/ස රණමයුර සමාගම කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි වීමට අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී. එහෙත් සමාගම වෙත කොටස් වෙළඳපොළ බලධාරීන් දන්වා සිටියේ ද්විතීයික පුවරුවේ ලියාපදිංචි විය හැකි බවයි. එසේ නම් සමාගම දැනටමත් සපුරා ඇති සුදුසුකම් කවරේද?

iii) මානව සම්පත් කළමනාකරණයෙන් පොදු අරමුණ වෙත ළඟාවීමට නම් එහි ඉලක්ක හා පරමාර්ථ ඉටුකරගත යුතුය.

අ) මානව සම්පත් කළමනාකරණයේ ඉලක්ක මොනවාද?

ආ) මානව සම්පත් කළමනාකරණ පරමාර්ථ හතරක් ලියන්න.

iv) ඔබ කිසියම් ආයතනයක මානව සම්පත් කළමනාකරු යැයි සිතන්න. ඔබ නිර්මාණය කළ ගිණුම් සහකාර තනතුර සඳහා රැකියා විග්‍රහයට අදාළව රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය සකස් කර පෙන්වන්න.

v) අ) බොහෝ ආයතන සිය පුරප්පාඩු සඳහා බාහිර ආකර්ශනය තෝරා ගනී. එසේ තෝරා ගැනීමට හේතු දක්වන්න.

ආ) මානව සම්පත් කළමනාකරු වශයෙන් ඔබ ආයතනයට අළුතින් පත්වීම් ලැබ පැමිණෙන සේවකයන් පිරිසක් අනුස්ථාපනය නොකරම කාර්යයන්හි යොදවනු ලැබිය. ඔබට මේ නිසා මුහුණ දීමට වන ගැටලු කවරේද?

08) i) පහත දැක්වෙන කරුණු දත්ත හා තොරතුරු වශයෙන් වෙන්කර දක්වන්න.

1) සේවකයෙකුගේ පැමිණීම.
2) ඒකකයක විකුණුම් පිරිවැය
3) සේවකයෙකුගේ නම හා වයස
4) දළ ලාභ අනුපාතය
5) විකුණුම් පිරිවැටුම
6) විකුණු භාණ්ඩවල වර්ගය හා මිල
7) ඒකකයක ගැනුම් මිල
8) ආර්ථික ඇනවුම් ප්‍රමාණය

ii) අ) හොඳ තොරතුරක පැවතිය යුතු ධනාත්මක ලක්ෂණ හතරක් පෙන්වා දෙන්න.

ආ) අතීතයේ සිට මේ දක්වා දත්ත සකස් කිරීමේ ප්‍රධාන ක්‍රම හතරක් හඳුනාගත හැකිය. ඒ මොනවාද?

iii) අ) බොහෝ සංවිධානවල කාර්යාල ස්වයංක්‍රීය පද්ධතියක් (OAS) භාවිතයට ගනු ලබන ක්‍රම හතරක් දක්වන්න.

ආ) පරිගණක ජාල සැකැස්ම අනුව ප්‍රධාන වර්ග හතරකි. ඒවා නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

iv) නවතම ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපාර සැලැස්මක් සැකසීමට ඔබට පැවරී ඇතැයි සිතන්න.

අ) එහිදී ඔබ අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

ආ) එම සැලැස්ම ලිඛිත සකස් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාද?

v) අ) එම සැලැස්මේ අලෙවිකරණ සැලැස්මට ඔබ ඇතුළත් කරන කරුණු මොනවාද?

ආ) නිසි ආකාරයක සැලැස්මක් ඔබ සතුව නොතිබුණු හොත් මුහුණපාන ගැටලු කවරේද?

******